# පළාත් පාලන මැතිවරණ කඩිනමින් පවත්වන්න

ලක්බිම

## පැෆරල් ඇමැතිගෙන් ඉල්ලයි

ගයාත්‍රි ගීගනආරච්චි

කඩිනමින් විසඳිය හැකි පළාත් පාලන ආයතනවල ගැටලු කඩිනමින් විසඳා, ඒවායේ මැතිවරණ පැවැත්වීම සඳහා ගැසට් පත්‍රය පළ කරන ලෙස ඉල්ලමින් පැෆරල් සංවිධානය, පළාත් පාලන අමාත්‍ය ෆයිසර් මුස්තාෆා මහතා වෙත ලිපියක් යවා තිබේ.

අනෙකුත් සියලුම පළාත් පාලන ආයතනවල මැතිවරණ ද කඩිනමින් පැවැත්වීමට ගත හැකි සියලුම ක්‍රියාමාර්ග ගන්නා ලෙස ද එම ලිපියේ දක්වා ඇත.

පළාත් පාලන ආයතනවල සීමා නිර්ණ ගැටලු හේතුවෙන් මැතිවරණ පැවැත්වීම අවස්ථා කිහිපයකදීම කල්දමා ඇති බවත්, එලෙස කල් දැමීම කිසිසේත්ම ප්‍රජාතන්ත්‍රවාදයට සුදුසු නොවන බවත්, එමගින් පෙන්වා දී තිබේ.

මේ සඳහා ප්‍රධාන වගකිවයුත්තා වර්තමාන අමාත්‍යවරයා නොවන නමුත්, හැකි ඉක්මනින් මේ සඳහා මැදිහත් වන ලෙස ද පැෆරල් සංවිධානය එම ලිපිය මගින් අමාත්‍ය ෆයිසර් මුස්තාෆා මහතාගෙන් ඉල්ලා තිබේ.